# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2066/17 - 2018 අප්‍රේල් මස 10 වැනි අඟහරුවාදා - 2018.04.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1971 අංක 29 දරන නිවාඩු පනතේ 10 (1) (ආ) වගන්තිය හා 11 (1) (ආ) වගන්තිය යටතේ නියමය

1971 අංක 29 දරන නිවාඩු පනතේ 10 (1) (ආ) වගන්තියෙන් හා 11 (1) (ආ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ස්වදේශ කටයුතු අමාත්‍ය වජිර අබේවර්ධන වන මම, ජාතික වෙසක් සතිය 2018 අප්‍රේල් 26 දින සිට 2018 මැයි 02 වන දින දක්වා යෙදීම හේතුවෙන්, ලෝක කම්කරු දිනය වෙනුවෙන් 2018 මැයි 01 අඟහරුවාදා දිනට යෙදී ඇති රජයේ හා බැංකු නිවාඩු දිනය අවලංගු කර ඒ වෙනුවට 2018 මැයි දිනය සැමරීම සඳහා 2018 මැයි 07 වන සඳුදා දින රජයේ හා බැංකු නිවාඩු දිනයක් විය යුතු බව ද මෙම නියමය මගින් ප්‍රකාශ කරමි.

වජිර අබේවර්ධන,
ස්වදේශ කටයුතු අමාත්‍ය.

2018 අප්‍රේල් මස 06 වැනි දින,
කොළඹ 07,
නිදහස් චතුරශ්‍රය,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

04 - 886

1A - G 27453 — 32 (2018/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*